# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2090/42 – 2018 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා – 2018.09.28

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ යොමු අංකය: IR/COM/01/N/2014/71.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.02.23 දිනැති හා අංක 1955/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.02.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වඩියුකොඩාල්, වඩිවුසවුත් වේල්ස්, ඥනසම්පත්තර් ලේන් හි පදිංචි ඒ. සුපේසන් මයා, පිළියන්දල, ගඩබුවාන පාර, නිව් සිටි, අංක 31 හි පදිංචි ඊ. කේ. එස්. සේනාධීර මයා, බණ්ඩාරගම, ගංගමුව, ශ්‍රී සුමංගල මාවත, අංක 54 හි පදිංචි ඒ. පී. ගමගේ මයා, බටගල, කොබෙයිතුඩුව, පෙර පාසල අසළ, බ්ලොක් 38 හි පදිංචි ඕ. සී. එන්. ජයවර්ධන මයා, තල්ගස්ගම, නියාගම, පවන හි පදිංචි කේ. එච්. ජී. බී. නාලනී මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 හි පිහිටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.05.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G G28614 – 16 (2018/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/COM/01/N/2014/71.

**කාර්මික අධිකරණයේ දී ය.**

1. ඒ. සුපේසන් මයා, ඥානසම්පත්තර් ලේන්, වඩිවුසවුත් වේල්ස්, වඩියුකොඩාල්,
2. ඊ. කේ.එස්. සේනාධීර මයා, අංක 31, නිව් සිටි, ගඩබුවාන පාර, පිළියන්දල,
3. ඒ. පී. ගමගේ මයා, අංක 54, ශ්‍රී සුමංගල මාවත ගංගමුව, බණ්ඩාරගම,
4. ඕ. සී. එන්. ජයවර්ධන මයා, බ්ලොක් 38, පෙර පාසල අසළ කොබෙයිතුඩුව, බටගල,
5. කේ. එච්. ජී. බී. නාලනී මිය, පවන, නියාගම, තල්ගස්ගම.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය : ඒ 3629

සහ

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

**අතර පවතින කාර්මික ආරාවුල,**

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධනය වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2016.02.16 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස්වරිය විසින් 2016.01.19 දින එවා ඇති ලිපියේ දැක්වෙන්නේ ;

*''ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි සේවය කරන ඒ. සුපේසන්, ඊ. කේ. එස්. සේනාධීර, ඒ. පී. ගමගේ, ඕ. සී. එන්. ජයවර්ධන, කේ. එච්. ජී. බී. නාලනී නමැති සේවක සේවිකාවන්ට 2010.11.05 දින සිට ශාඛා අලෙවි කළමනාකරුවන් ලෙස උසස්වීම ලබාදීමේ දී එතෙක් භුක්ති විඳි අන්තර් දීමනා 01, ජීවන වියදම් ගැලපීමේ දීමනාව වැනි දීමනා අහිමි කිරීම යුක්ති සහගත ද යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඔවුන් වෙත ලබා දියයුතු සහන කවරේද යන්නත් පිළිබඳ වේ.'' යනුවෙනි.*

**පෙනීසිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම පරීක්ෂණය 2016.05.19 දින මුල් වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද 2018.04.06 දින දක්වා කාලය තුළ 2016.05.19, 2016.06.16, 2016.07.22, 2016.08.16, 2016.09.13, 2016.11.30, 2017.01.24, 2017.04.06, 2017.05.25, 2017.08.16, 2018.03.06, 2018.04.04, 2018.04.06. දිනවල දී පරීක්ෂණය පැවැත්වුණි. පරීක්ෂණය සඳහා දින නියම කරනු ලැබුව ද 2016.05.16, 2016.07.29, 2016.08.25, 2016.09.06, 2016.11.30, 2017,01.03, 2017,02.13, 2017,05.16, 2017,07.10, 2017,09.11, 2018.03.27 යන දිනයන්හි දී විවිධ හේතුන් මත පරීක්ෂණය පැවැත්වුනේ නැත.

පරීක්ෂණය පැවැත්වුනු සෑම දියනක දී ම පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් සියලු දෙනා ම හෝ කීප දෙනෙක් පැමිණ සහභාගි වූහ. පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් 2016.05.19 දින සිට 2017.08.16 දක්වා පරීක්ෂණය පැවැත්වූ දිනයන්හි දී නීතිඥ සුසන්ත ගුණසේකර මහතා පෙනී සිටයත් 2016.09.13 දින සිට පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් නීතිඥවරයෙකුගේ පෙනී සිටීමක් සිදු වූනේ නැත. දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් පරීක්ෂණය පැවැත්වුනු බොහෝ දිනයන්හි දී, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි සේවක සම්බන්ධතා සහායක තරිඳු චතුරංග මහතා සමග කළමණාකරු (සේවක සබඳතා) නීතිඥ ඉඳුනිල් නවරත්න මහතා පැමිණ සහභාගි විය. දෙවන පාර්ශ්වයේ අයතනය වෙනුවෙන් පරීක්ෂණය පැවැත්වුන. 2016.05.19, 2016.06.16 යන මුල් දිනයන්හි දී පමණක් නීතිඥ අංජලී විජයසිංහ මහත්මිය පෙනී සිටියා ය. ඉන්පසු බේරුම්කරණ විභාග දිනයන් හි දී දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ පෙනී සිටීමක් සිදු නොවින.

**පසුබිම**

මෙම බේරුම්කරණ යොමු කිරීමට අදාළ ව උද්ගත වී ඇති කාර්මික ආරාවුල පිළිබඳ පසුබිම වන්නේ පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ට තම තනතුරුවල උසස්වීම් ලැබීමේ දී තමන් එවකට භුක්ති විඳිමින් සිටි අනෙකුත් වරප්‍රසාද සේවායෝජක විසින් අහිමි කරනු ලැබීම බව පළමුවැනි පාර්ශවයේ ඉල්ලුම්කරුවෝ කියා සිටියහ. එනම් ඉල්ලුම්කරුවන් අතුරෙන් ඒ. සුපේසන් මහතා, ඒ. පී. ගමගේ මහතා, ඕ. සී. එන්. ජයවර්ධන මහතා සහ කේ. එච්. ජී. බී. නාලනී මහත්මිය IV වන ශ්‍රේණියේ ශාඛා පරිපාලක නිලධාරීන් වශයෙන් සේවය කරමින් සිටි අතර ඔවුන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි විධායක IV වන ශ්‍රේණියේ ශාඛා කළමනාකරුවන් ලෙස ද, ඊ. කේ. එස්. සේනාධීර මහතා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ III වන ශ්‍රේණියේ විධායක තනතුරක සිට III වන ශ්‍රේණියේ අලෙවි කළමනාකරුවකු ලෙස ද නිසි උසස් කිරීමේ පටිපාටියට අනුකූල ව 2010.11.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කරනු ලැබ ඇත. කෙසේ වුව ද එකී උසස්වීම්, ලැබීමට පෙර භුක්ති විඳිමින් සිටි අතුරු දීමනාව, ජීවන වියදම් දීමනාව, ආහාර දීමනාව, ප්‍රවාහන දීමනාව, යන දීමනාවන් අහිමි කරනු ලැබීම නිසා ඔවුන්ට බරපතල අගතියක් සිදු වූ බව ඉල්ලුම්කරුවන්ගේ ස්ථාවරය විය. ඔවුන්ගේ තර්කය වූයේ ඒ නිසා උසස්වීමත් සමග ඊට පෙර ලබමින් සිටි සමස්ත මාසික ඉපැයුම බරපතල ලෙස අඩු වූ බවය. උදහරණයක් වශයෙන් ඉහත කී සුපේසන් මහතාගේ මූලික වැටුප මෙම උසස්වීමත් සමග රු. 13,054/- සිට රු.19,000/- දක්වා වැඩි වූවත් පෙර කී දීමනා අහිමි කිරීම හේතුවෙන් එවකට ලබමින් සිටි සම්පූර්ණ මාසික ඉපැයුම රු. 29,169.46/- සිට රු.20,000/- දක්වා අඩු වී ඇත. ඔවුනොවුන්ට සිදු වූ අවාසියේ මුදල්මය අගයන්හි සුළු සුළු වෙනස්කම් කීපයක් තිබුන ද ඉල්ලුම්කරුවන් පස්දෙනාටම පොදු වූ තත්ත්වය මෙය විය.

ඒ අනුව ඔවුන් ඉල්ලා සිටියේ ලැබුණු උසස් වීමට අදාළ ව තමන්ට අහිමිකළ ඉහත කී දීමනාවන් 2010.11.15 දින සිට බලපැවැත්වෙන සේ ලබා දෙන ලෙස ය.

ආරම්භයේ දී ම දෙවන පාර්ශ්වය මූලික විරෝධතාවක් ගෙන එමින් කියා සිටියේ ආයතනයේ පිරිස් පාලන කටයුතු සාමූහික ගිවිසුමකින් පාලනය වන නිසා මෙකී ඉල්ලීම් බේරුම්කරණ ක්‍රියාමාර්ගයක් හරහා ලබාගැනීමට ඉල්ලුම්කරුකාර පළමුවැනි පාර්ශ්වයට අයිතියක් නොමැති බවයි. මෙකී මූලික විරෝධතාවට පළමුවැනි පාර්ශ්වයෙන් පිළිතුරු ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමටත් පෙරාතුව ම දෙපාර්ශ්වය අතර සමථ වෑයමක් දියත් විය. ඒ අනුව දෙවැනි පාර්ශ්වය එකී මූලික විරෝධතා තවදුරත් ඉදිරියට ගෙන යාමට උනන්දුවක් නොදැක්වීය. ඒ අනුව මූලික විරෝධතාව පිළිබඳ නිගමනයක් ලබාදීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුණු අතර බේරුම්කරණ විභාග දිනයන්හි දී සම්පූර්ණයෙන් ම වාගේ සිදුවූනේ හබ කිරීම් ඇතුළත් පරීක්ෂණ විභාග වෙනුවට දෙපාර්ශ්වය සෑහීමට පත් විය හැකි සමථයකට එළඹීම සඳහා සිදු වූ සාකච්ඡාවන් ය. එකී සාකච්ඡාවන් දිරිමත් කරවමින් සමථ වෑයම සඳහා මූලික පසුබිම බේරුම්කරණය විසින් සකසන ලද අතර දෙවන පාර්ශ්වය ඒ සඳහා අවංක උත්සාහයක් ගන්නා ලද බව පෙනී. ගියේ ය. අනෙක් අතට ඉල්ලුම්කරුවන් තමන්ට සෑහිමකට පත් විය හැකි ආකාරයෙන් විසඳුමක් ලබාගැනීමට උත්සාහයක් ගත්තා විනා අනවශ්‍ය හබ කිරීම් වලට පෙළඹුනේ නැත.

දින ගනණාවක් තිස්සේ බේරුම්කරණයේ දී, දීර්ඝ වශයෙන් කරන ලද මැදහත් වීම් වලට අමතර ව ආයතනය තුළ ද ඉල්ලුම්කරුවන් සහ කළමනාකාරිත්වය අතර පවත්වන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් 2018.04.04 සහ 2018.04.06 දිනයන් හි පැවැත්වූ පරීක්ෂණ විභාග අවස්ථාවල දී පිළිගත හැකි වූ සමථ යෝජනාවකට දෙපාර්ශ්වය අත්සන් තැබූහ. එකඟ වූ සමථ යෝජනාව ප්‍රකාර ව කරන ලද වැටුප් ගැලපීම මෙම ප්‍රදනයට අමුණා ඇති ඇමුණම් 1ට ඇතුළත් කොට ඇත.

**ප්‍රදානය ඉදිරිපත් කිරීමේ ස්ථාවරය**

ඉහතින් සඳහන් කරන ලද සමථ එකඟතාව පදනම් කරගෙන මෙම ප්‍රදානය කරනු ලැබේ.

**ප්‍රදානය**

1. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් හතර දෙනා සහ ඉල්ලුම්කාරිය මේ සමග අමුණා ඇති ඇමුණුම් 1 හි දැක්වෙන වගුව ප්‍රකාර ව ගණනය කරන ලද වැටුප් තලයන්හි පිහිටවිය යුතු ය.

2. ඒ අනුව පළමුවැනි පාර්ශ්වයේ එක් එක් ඉල්ලුම්කරුවන්ට පෞද්ගලික වන සේ අදාළ පහත සඳහන් වැටුප් තලයන් 2018.04.01 දින සිට බලපැවැත්වෙන සේ ලබා දිය යුතු ය.

| | | |
|---|---|---|
| අ. | ඒ. සුපේසන් මහතා | රු.81,358.63 |
| ආ. | ඊ. කේ. එස්. සේනාධීර මහත | රු.96,390.08 |
| ඇ. | ඒ. පී. ගමගේ මහතා | රු.89,535.58 |
| ඈ. | ඕ. සී. එන්. ජයවර්ධන මහතා | රු.88,600.38 |
| ඉ. | කේ. එච්. ජී. බී. නාලනී මහත්මිය | රු.80,623.43 |

3. 2018.03.31 දක්වා කාලයට කිසිදු හිඟ වැටුපකට ඉල්ලුම්කරුවෝ හිමිකම් නොලබති.

4. බේරුම්කරණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් කිසිදු වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හිමි නොවිය යුතු ය.

5. මෙකී ප්‍රදානයන් ගැසට් පත්‍රය පළවීමෙන් වලංගු වේ.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2018 මැයි මස 15 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

10 - 390

---

මගේ අංකය: IR/COM/01/Q/2014/141.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2015.12.28 දිනැති හා අංක 1947/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.12.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නුගේගොඩ, උඩහමුල්ල, තලපත්පිටිය පාර, අමරතුංග මාවත, අංක 04 ඒ හි පදිංචි ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, විජේරාම මාවත, අංක 114 හි පිහිටි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.09.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/01/Q/2014/141.

**කාර්මික අධිකරණයේ දී ය.**

ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මිය,
අංක 4 ඒ, අමරතුංග මාවත,
තලපත්පිටිය පාර,
උඩහමුල්ල,
නුගේගොඩ.
(ඉල්ලුම්කාරිය)

නඩු අංකය : ඒ - 3612

සහ

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
අංක 114, විජේරාම මාවත,
කොළඹ 07.
(වග උත්තරකරු)

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාරේ අංක 77, ටී. පියසෝම වන මා 2015.12.09 වන දින පත්කොට මෙම ආරාවුල මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ ;

''හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පරිපාලන නිලධාරි (වැඩසටහන්) II ශ්‍රේණිය ලෙස උසස්වීම් ලබා 2012.12.20 දින සිට 2013.12.31 දින දක්වා සේවය කළ ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මහත්මියට ලබා දී තිබූ එම තනතුර අවලංගු කර 2014.01.01 දින සිට නැවත පෙර සිටි තනතුරට පත්කිරීම යුක්ති සහගත වන්නේ ද? යන්න හා එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඇයට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

ඉන් අනතුරුව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරි විසින් ඉල්ලුම්කාරිය වන ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මහත්මිය වෙත යවන ලද 2016.01.11 දිනැති ලිපියට 2016.01.18 දිනැති ලිපියෙන් විස්තරාත්මක පිළිතුරක් එවා ඇත. ඇය දරූ තනතුර පුද්ගලික පළිගැනීමක් මත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පාලනාධිකාරිය විසින් සිදුකර ඇති බැව් රූපසිංහ මහත්මියට හැඟී යන බැවින් විධිමත් පරීක්ෂණයේ දී ඇය වෙනුවෙන් පෙනී සිටීමට තෝරා ගන්නා ලද නීතිඥ මහතා මගින් හෙළිදරව් කරන බව ද ලේඛකාධිකාරී වෙත එවන ලද 2016.01.18 දිනැති ලිපියේ ඇය සඳහන් කර ඇත.

දෙපාර්ශවයේ ම මූලික ප්‍රකාශ බේරුම්කරණයට ලබා දීමෙන් පසු අනිත් පාර්ශ්වයන්ගේ ප්‍රතිප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවස්ථා ලබාදීමෙන් පසු බේරුම්කරණ පරීක්ෂණය 2016.03.31 දින ආරම්භ කර ඇති අතර ප්‍රථමයෙන් වගඋත්තරකාර පාර්ශ්වය සාක්ෂි ආරම්භ කළ යුතු බැව් බේරුම්කරණය තීරණය කරන ලදී. ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ මාධව විජය ශ්‍රී වර්ධන මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ තේජානි ගුණසේකර මහත්මිය පෙනී සිට පසුව වෙනත් නීතිඥවරුන් ද මාගේ අනුමැතිය ඇතිව වරින් වර පෙනී සිට ඇත.

ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද විස්තර ප්‍රකාශ ඇතුළත් පහත සඳහන් කරුණු වැදගත් වේ.

(i) වගඋත්තරකාර ආයතනය විසින් වර්ෂ 2012 ජුනි මස 03 වැනි දින ''R-1'' දරන පුවත්පත් දැන්වීම මගින් පරිපාලන නිලධාරි II ශ්‍රේණියට අදළ තනතුරු 02ක් සම්බන්ධව අභ්‍යන්තර හා බාහිර දෙයාකාරයෙන් ම අයදුම්පත් කඳවා තිබූ අතර, අභ්‍යන්තර අයදුම්කරුවෙකුට අවශ්‍ය සුදුසුකම් වශයෙන් අදළ තනතුරු සම්බන්ධ ක්ෂේත්‍රයක I ශ්‍රේණියේ කළමනාකරණ සහකාර කාණ්ඩයේ තනතුරක වසර 05 ක සතුටුදයක සේවා කාලයක් සපුරා තිබීම දක්වා තිබුණි. එම සුදුසුකම සපුරා තිබූ නිසා තනතුර සඳහා අයදුම් කරන ලද බව ඉල්ලුම්කාරිය පවසා ඇත. මේ කාලය ඇතුළත මේ නිලධාරිණියගෙන් කිසිඳු විනය විරෝධී වරදක් හෝ වෙනත් වරදක් සිදු වී නොමැත.

(ii) ''X3'' ලෙස සලකුණු කර ඇති 2006 වසරේ නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 වගඋත්තරකාර ආයතනයේ ක්‍රියාත්මක වූයේ 2012 වසරේ සිට බවත්, ඉල්ලුම්කාරියට වසර 05ක සේවා කාලයක් සපුරා නොතිබුණ බැවින් ඇයට ලබා දී තිබූ පරිපාලන නිලධාරි (වැඩසටහන්) II ශ්‍රේණියේ තනතුර සඳහා බඳවාගත් ආකාරය නීත්‍යානුකූලව, විනිවිදභාවයෙන් හා සාධාරණ ආකාරයෙන් සිදු නොවූ බවට විගණන වාර්තා සහ පරීක්ෂණ කමිටු වාර්තාවලින් තහවුරු වී ඇති බැවින් 2014.01.01 දින සිට පත්වීම අවලංගු කර පෙර සිටි තනතුරට පත්කරන ලෙස පාලක මණ්ඩලය විසින් තීරණය කර ඇති බවත් වගඋත්තරකාර ආයතනය විසින් දක්වා ඇත. එසේ වුවත් ඉල්ලුම්කාරිය වෙනුවෙන් රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව වැටුප් සංශෝධනය සිදුකර 2006.01.01 දින සිට වැටුප් ලබා දී ඇති බවත් එදින සිට ඇය කළමනාකරණ සහාය කාණ්ඩයට ඇතුළත් කර ඇති බවත් 2007.01.24 දිනැති ''R-4'' ලේඛනයෙහි සඳහන් ව තිබීමෙන් වගඋත්තරකාර ආයතනය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30, 2006.01.01 දින සිට ක්‍රියාත්මක කර ඇති බව මනාව තහවුරු වේ. මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2006.01.01 දිනට ඉල්ලුම්කාරියට රු. 17,240 ක වැටුප් තලයක් ලබා දී ඇත.

(iii) ''X3'' වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ දක්වා ඇති පරිදි MA 1-2 I වන ශ්‍රේණියට අදළ වැටුප් පියවරක් ලබන තැනැත්තෙකු MA 1-2 I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන බව ''X2'' වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති වගඋත්තරකාර ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියේ 37 වන පිටුවේ III C අයිතමය යටතේ දක්වා ඇති අතර ''X3'' චක්‍රලේඛ අංක 30 හි (2) පිටුවෙහි කළමනාකරණ සහකාර සේවාවන්වලට අදළ තනතුරු සම්බන්ධ ක්ෂේත්‍රයේ තනතුරක් ලෙස ඉල්ලුම්කාරිය දැරූ ලඝු/යතුරු ලේඛිකා තනතුර ද ඇතුළත් වේ. වගඋත්තරකාර ආයතනයේ අභ්‍යන්තර විගණකවරියගෙන් අසන ලද හරස් ප්‍රශ්නවලදී ඉල්ලුම්කාරිය ඒ වන විට දරමින් සිටි ලඝු/යතුරු ලේඛිකා තනතුර පවා අදළ ක්ෂේත්‍රයට වැටෙන බව පිළිගෙන තිබීමෙන් ඒ තුළින් ඉල්ලුම්කාරි හට අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද තිබූ බව මැනවින් ඔප්පු වී ඇති බවත් පැහැදිලි ය.

(iv) ඒ අනුව ''X3'' වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ යම්කිසි පුද්ගලයෙකු 23 වන වැටුප් පියවරට පැමිණි විට ඔහු හට රු. 16,950 ක වැටුප් තලයක් හිමිවීම මත I ශ්‍රේණියට සුදුසුකම් ලබන බව දක්වා ඇති බවත්, එකී චක්‍රලේඛයේ MA 1-2 I වන ශ්‍රේණියට හිමි රු. 16,950 ක වැටුප් තලයට වඩා වැඩි වැටුප් තලයක් ඉල්ලුම්කාරිය විසින් ලබා තිබීම මත ඉල්ලුම්කාරිය වර්ෂ 2006 ජනවාරි මස 01 වන දින සිට MA 1-2 I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ බවත් පැහැදිලි වේ.

(v) වර්ෂ 2006 ජනවාරි මස 01 වන දින සිට කළමනාකරණ සහකාර කාණ්ඩය හඳුන්වා දෙනු ලැබුව ද වගඋත්තරකාර ආයතනය විසින් කිසිඳු අවස්ථාවක ඉල්ලුම්කාරියගේ ශ්‍රේණිය කුමක්ද? යන්න සම්බන්ධයෙන් ලිඛිත හා / හෝ වාචිකව දැනුම්දීමක් සිදු නොකරන ලද බවත්, එසේ වුව ද ඉල්ලුම්කාරිය ඉහත කී තනතුරට ඉල්ලුම් කරනු ලබන අවස්ථාව වන විට අදළ පුවත්පත් දැන්වීමෙහි ඉල්ලුම්කර තිබූ සුදුසුකම වන අදළ තනතුරු සම්බන්ධ ක්ෂේත්‍රයක පළමු වන ශ්‍රේණියේ කළමනාකරණ සහකාර කාණ්ඩයෙහි තනතුරක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබූ බව මනාව පැහැදිලි ය.

(vi) වගඋත්තරකාර ආයතනය විසින් ''R-5'' වශයෙන් සළකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛනයෙහි දක්වා ඇති සාවද්‍ය ස්ථාවරය නිවැරදි කරමින් එය අවලංගු කර එම ආයතනය විසින් ම ''X13'' වශයෙන් සළකුණු කර ඉදිරිපත් කරන ලද වර්ෂ 2013 පෙබරවාරි මස 08 දිනැති ලිපිය මගින් ඉල්ලුම්කාරිය වර්ෂ 2012 පෙබරවාරි මස 06 වැනි දින වන විට MA 1-2 I වන ශ්‍රේණියේ 08 වන වැටුප් පියවරට පවා හිමිකම් ලබා ඇති බවත් දක්වා ඇත. වගඋත්තරකාර පාර්ශ්වය ඒ ගැන නිහඬතාවයක් දක්වා ඇත.

(vii) ඉහත තනතුර සඳහා තෝරා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති වශයෙන් වගඋත්තරකාර ආයතනයේ පාලක මණ්ඩල සාමාජික ආරියරත්න මහතා ද, වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂවරයා වූ ලලිත් කාන්ත ජයසේකර මහතා සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරිණියක් ද කටයුතු කර ලද බවත්,

(viii) පසුව වගඋත්තරකරු විසින් ''X11'' දරන ලිපිය මගින් වර්ෂ 2012 දෙසැම්බර් මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කාරිය වගඋත්තරකාර ආයතනයේ වැඩසටහන් අංශයේ පරිපාලන නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරට පත්කර ගෙන ඇති බව දැනුම් දී සිටින ලද බවත්, එකී පත්වීම පාලක මණ්ඩලයේ දී අනුමැතිය මත සිදු කරන ලද පත් කිරීමක් වූ බවත්,

(ix) එකී තනතුර ඉල්ලුම්කාරිය වෙත ලැබීම හේතුවෙන් ඇය විසින් ඊට පෙර ලබමින් සිටි වැටුප වැඩිවීමක් සහ ඊට පෙර දරනු ලැබූ තනතුරට වඩා උසස් තනතුරක් හිමි වීම සිදු වූ බවත්,

(x) ''X12'' දරන ලිපියෙන් තනතුර අවලංගු කර පෙර සිටි තනතුරට පත්කිරීම මගින් වගඋත්තරකරු විසින් තෝරා පත්කර ගනු ලැබූ ඉල්ලුම්කාරිය වගඋත්තරකරු විසින් ම නීත්‍යානුකූල නොවන ආකාරයෙන් තෝරාගෙන ඇති බවට ප්‍රකාශ කර ඇති බවත්,

(xi) එකී ''X12'' දරන ලිපිය මගින් ඉල්ලුම්කාරිය ඒ වන විට දරමින් සිටි පරිපාලන නිලධාරී II වන ශ්‍රේණිය තනතුර අවලංගු කිරීම සඳහා එකී ලිපියට පූර්වයෙන් එනම් වර්ෂ 2013.12.31 වැනි දිනට පූර්වයෙන් ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනයේ පාලක මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණ ද ඒ බව තහවුරු කිරීමට වගඋත්තරකරු විසින් මෙම බේරුම්කරණය වෙත කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැති බවත්,

(xii) ඒ අනුව අදළ තීරණය පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව ගනු ලැබූ තීරණයක් බවත්,

සඳහන් වී ඇත.

(xiii) එකී '' X12 '' දරන ලිපිය මගින් දක්වා තිබූ '' R6 '' සහ '' R7 '' දරන විගණන තොරතුරු කැඳවීම/විමසීමෙහි අඩංගු කරුණු සාවද්‍ය වන අතර මේවා විගණන වාර්තාවන් නොවන අතර විගණන විමසුම් පමණක් වන බවත් පැහැදිලිය.

(xiv) '' X12 '' දරන ලිපිය මගින් දක්වා තිබූ '' R10 '' ලෙස සලකුණු කළ පරීක්ෂණ කමිටු වාර්තාව මගින් ඒ වන විට පත්වීම් ලබා තිබූ ඉල්ලුම්කාරී හට අගතියක් නොවන ආකාරයෙන් කටයුතු කළ යුතු බව පැහැදිලිව දක්වා තිබියදී වගඋත්තරකරු විසින් ඉල්ලුම්කාරිය දරමින් සිටි පරිපාලන නිලධාරී II වන ශ්‍රේණියේ තනතුර අවලංගු කිරීම මගින් එම '' R10 '' පරීක්ෂණ කමිටු වාර්තාවට පටහැනිව අසද්භාවයෙන් කටයුතු කර ඇති බවත් පැහැදිලි වේ.

(xv) තනතුර අහිමි කිරීම හේතුවෙන් ඉල්ලුම්කාරිය වගඋත්තරකාර ආයතනයේ දරමින් තිටි තත්වය පහළ වැටීමක් සිදු වූ බවත්, වැටුප් අඩුවීමක් සිදු වූ බවත්, එමෙන්ම සහෝදර සේවකයින් ඉල්ලුම්කාරිය දෙස වැරදි ආකාරයෙන් බලන ලද බවත්, ඉල්ලුම්කාරිය මානසිකව ඇද වැටුණු බවත්, මේ හේතුවෙන් පවුලේ කටයුතු වලට ද අහිතකර ලෙස බලපෑ බවද ඉල්ලුම්කාරියට බලවත් අගතියක් සහ අසාධාරණයක් වගඋත්තරකාර ආයතනය විසින් සිදුකර ඇති බව ද පෙනේ.

(xvi) වගඋත්තරකාර ආයතනයේ අභ්‍යන්තර විගණකවරියගේ 2016.07.04 දිනැති සාක්ෂිය මගින් දක්වා ඇත්තේ ඉල්ලුම්කාරිය හට කළමනාකරණ සහකාර I වන ශ්‍රේණිය ලබාදී ඇත්තේ 2012 වසරේ දී නොව 2009 වසරේදී බවයි. මෙවැනි පරස්පර විරෝධී සාක්ෂි වල සඳහන් තොරතුරු ඇය විසින් සාවද්‍ය ආකාරයට විගණන විමසුම් සඳහා ද ලබා දී ඇත. ඒ අනුව මෙමගින් බේරුම්කරණය වෙත ඉතා මැනවින් අවබෝධ වනු ඇත්තේ වගඋත්තරකරුහට ඉල්ලුම්කාරියගේ සේවා කාණ්ඩය සම්බන්ධයෙන් ද කිසිදු නිශ්චිතතාවයක් නොමැති බවත් ය.

(xvii) එපමණක් නොව ඉහත අභ්‍යන්තර විගණකවරිය විසින් මූලික සාක්ෂි ලබා දෙමින් ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු නොකරන ලද බව දක්වා ඇති නමුත් පසුව එකී සාක්ෂිකාරියගෙන් නගන ලද හරස් ප්‍රශ්නවලදී මුල් ස්ථාවරය වෙනස් කරමින් එකී සාක්ෂිකාරිය විසින් ''R11 '' වශයෙන් 2014 පෙබරවාරි මස 19 වන දින ඇය විසින් සකස් කරන ලද අභ්‍යන්තර විගණනය සිදු කරන ලද බවත් දක්වා තිබුණ ද, ඉල්ලුම්කාරිය දරමින් සිටි පරිපාලන නිලධාරී II වන ශ්‍රේණියේ තනතුර 2014 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීමට වගඋත්තරකරු විසින් පසු දිනක දී ඉදිරිපත් කරන ලද මෙම ''R11'' ලේඛනය මගින් කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකි බවත් මනාව තහවුරු වේ.

(xviii) 2017.10.20 දින වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු වන මොහාන් දීපාලාල් මහතා පවසන පරිදි ආයතනයේ බඳවාගැනීමේ පටිපාටිය උල්ලංඝණය කර තිබේ නම් එය ඉල්ලුම්කාරියගේ වරදක් නොවන බවත් එය ආයතනයේ පරිපාලනයේ වරදක් වන බවත් ය.

(xix) 2012.12.20 දින සිට 2014.01.01 දින දක්වා වසරකට අධික කාලයක් පරිපාලන නිලධාරී (වැඩ සටහන්) II වන ශ්‍රේණියේ ස්ථිර තනතුරෙහි පිහිටුවා EPF සහ ETF වලට මුදල් බැර කර ඇති බවත් පෙන්වා දී ඇත. මේ නිලධාරිණියට දඬුවම් දීම යුක්තිය හා සාධාරණයට පටහැනි බැව් ඉහළ නිලධාරීන්ට අමතක වී ඇති බැව් පෙනේ.

(xx) ඒ අනුව වගඋත්තරකරු විසින් '' X12 '' දරන ලිපිය මගින් ඉල්ලුම්කාරිය දරමින් සිටි පරිපාලන නිලධාරී II වන ශ්‍රේණිය තනතුර වර්ෂ 2014 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීම බෝසත් ගුණ පිරි හෙක්ටර් කොබ්බෑකඩුව විද්වතාණන්ගේ දර්ශණයට ද අගතියක් වී ඇතැයි මාගේ වැටහීම යි.

අවසානය

(i) කරුණු එසේ වුවද බේරුම්කරණයේ දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගැනීමේ දී ඉල්ලුම්කාරියට පහත සඳහන් පරිදි තනතුර ප්‍රදානය කිරීමෙන් මෙන්ම මූල්‍ය හානියක් සිදු වී ඇති බැව් මාගේ පිළිගැනීමයි.

(ii) ඉල්ලුම්කාරිය විසින් ඉහත කී තනතුරට ඉල්ලුම් කරනු ලබන අවස්ථාව වන විට වගඋත්තරකාර ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව හා අදාළ පුවත්පත් දැන්වීමට අනුව කළමණාකරණ සහකාර කාණ්ඩයේ I වන ශ්‍රේණියේ තනතුරක වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබූ බවට තීරණය කරමි.

(iii) ඉල්ලුම්කාරිය වෙත 2012.12.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව නීත්‍යානුකූලව ලබාදුන් පරිපාලන නිලධාරි (වැඩ සටහන්) II ශ්‍රේණිය පත්වීම අවලංගු කිරීම නීත්‍යානුකූල නොවන බව මම තීරණය කරමි.

(iv) ඉල්ලුම්කාරිය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පරිපාලන නිලධාරි (වැඩ සටහන්) II වන ශ්‍රේණිය තනතුරට වර්ෂ 2014 ජනවාරි 01 දින සිට නැවත පත්කර ඉල්ලුම්කාරිය වෙත එකී තනතුරට හිමිවිය යුතු සියළු හිඟ වැටුප් හා දීමනා ලබා දෙන ලෙස නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කොට දෙමසක් (මාස 02ක්) ඇතුළත ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මහත්මියට ගෙවා අවසන් කරන ලෙස හා තනතුර ප්‍රදානය කරන ලෙසට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට නියෝග කරමි. මෙම ප්‍රධානය යුක්ති සහගත සහ සාධාරණ බව මාගේ නිගමනයයි.

නීතිඥ ටී. පියසෝම.
බේරුම්කරු.

2018 සැප්තැම්බර් මස 11 වැනි දින,
නාරාහේන්පිට,
කම්කරු මහලේකම් කාර්යාලයේ 09 වන මහලේ කාර්මික අධිකරණයේ දී ය.

10 - 391

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.